## උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය- 2018

------------------------------------------------------------

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 අගෝස්තු 27 දින එළඹි අංක 2639 එස් ආර් අයි දරණ ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සහ 2013 මැයි 31 දින එළඹි අංක 2890 එස් ආර් අයි සහ අංක 2891 එස් ආර් අයි දරණ ණය ගිවිසුම් ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, එවකට වරාය සහ මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහා මාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු සහ උතුරු මැද පළාත් වල ජාතික මාර්ගය කිලෝ මීටර් 197.8 ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ කටයුතු සිවිල් වැඩ, උපදේශනය හා ව්‍යාපෘති කළමනාකරණය යන සංරචක 03 යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 20,690 කට සමාන එජඩො මිලියන 176 ක් වූ අතර ඉන් රු.මිලියන 18,850 කට සමාන එජඩො මිලියන 160 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ඔක්තෝම්බර් 22 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘති කාල සීමාව 2019 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර ඇත.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වියාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ,වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි.තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1. ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රුපියල් මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| මාර්ග නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තු 20 ට අදාල ගෙවිය යුතු මුදල් ගිණුම් වලට ගෙන නොතිබුණි. | 51.20 | මූල්‍ය ප්‍රකාශන වල පෙන්වන ලද එකතුව රු.මිලියන 146.23 ක් වූ උපචිත වියදම් එම අගයෙන් අඩුවෙන් පෙන්නුම් කෙරේ. | අදහස් දක්වා නොමැත. | වර්ෂ අවසාන ශේෂයන්ගේ නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා වර්ෂ අවසානයේ ගෙවිය යුතු සියළු ගෙවීම් සලකා බැලිය යුතුය. |

## 2.2. නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| මුදල් රෙගුලාසි 134 (3) හා 2010 ජූලි 26 දිනැති අංක 05 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය | රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් ව්‍යාපෘතියේ ගණුදෙනු අභ්‍යන්තර විගණනයට ලක් නොවීම. | මූල්‍ය ප්‍රකාශයන්ගේ දක්වා ඇති ශේෂයන්ගේ නිරවද්‍යතාවය | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘතියේ ගෙවීම් වල වලංගුභාවය තහවුරු කිරීම සඳහා ව්‍යාපෘති ගණුදෙනු අභ්‍යන්තර විගණනයට ලක්විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

## 3.1. භෞතික ප්‍රගතිය

ආරම්භක ක්‍රියාත්මක කිරීමේ සැලසුමට අනුව ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කරන ලද උතුරු හා උතුරුමැද පළාත් වල ජාතික මාර්ග 06 ක කිලෝමීටර් 169.94 ක පුනරුත්ථාපන වැඩ හා ඉහත පළාත් වලම වෙනත් ජාතික මාර්ග 07 ක කිලෝමීටර් 117.48 ක පුනරුත්ථාපන වැඩ අතිරේක මූල්‍යායන සැකසුම් යටතේ 2016 දෙසැම්බර් 31 දින නිමකර තිබුණි. ආරම්භක ණය ගිවිසුමේ වෙන්කරන ලද මුදලින් රුපියල් මිලියන 1,842.93 ඉතුරු වීම් යොදා ගනිමින් වෙනත් ජාතික මාර්ග 03 ක පුනරුත්ථාපන වැඩ 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඉටුකරමින් පැවතුණි. ලබාගත හැකි වූ තොරතුරු අනුව, අතිරේක මූල්‍යායන ගිවිසුම යටතේ

වෙන්කරන ලද මුදලින් එකතුව රුපියල් මිලියන 907.31 ක මුදලක් වියදම් නොකර ඉතිරිව තිබූ අතර එය 2019 වර්ෂයේදී වෙනත් ජාතික මාර්ග පුනරුත්ථාපනය සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කර තිබුණි.

**3.2. කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| මාර්ග පුනරුත්ථාපන පිරිවැය ඇස්තමේන්තු වල ඉතිරිවීම් භාවිතා කිරීම සඳහා ව්‍යාපෘතියේ විෂය පථය අවස්ථා 03 දී සංශෝධනය කර තිබුණි. | කොන්ත්‍රාත් පිරිවැය ඇස්තමේන්තු වල දුර්වල මූල්‍ය පාලනය | අදහස් දක්වා නොමැත. | බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදල් උපරිම අයුරින් යොදා ගැනීම තහවුරු කිරීම පිණිස එක් එක් පැකේජයන්ගේ පිරිවැය නිවැරදිව ඇස්තමේන්තු ගත කල යුතුය. |

**3.3. මතභේදයට තුඩුදුන් කරුණු**

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| දඹුල්ල සිට තෝනිගල දක්වා මාර්ග කිලෝමීටර් 23.35 සහ තෝනිගල සිට ගල්කුලම දක්වා මාර්ග කිලෝමීටර 24.17 ක කාර්යසාධන පදනම් නඩත්තු කොන්ත්‍රාත් පිළිවෙලින් රුපියල් මිලයන 20.4 කට හා මිලියන 5.3 කට ඇස්තමේන්තුගත පිරිවැයකට පිරිනමා තිබුණි. කෙසේ වෙතත් සමාන දිගකින් යුත් මාර්ග කොන්ත්‍රාත් වල සැලකිය යුතු පිරිවැය වෙනසට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි. | ලංසු ඇගයීමේදී නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම නිසා ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන කොන්ත්‍රාත්තුවල පිරිවැය අනවශ්‍ය ලෙස වැඩි වී ඇත. | අදහස් දක්වා නොමැත | මාර්ග නඩත්තු පද්ධතියක් හා පැහැදිලි කප්පාදු පටිපාටි ස්ථාපිත කල යුතු අතර ඒ මත ලංසු ඇගයීම සිදු කල යුතුය. |